

# භික්ෂූන් හත් නමකගේ මහා පාවාදීම: හිමාලයා ප්‍රකාශයේ යටි අරමුණු

ගෝලීය දෙමළ සංසදය සහ රටේ බහුතර ජනතාව නොදන්නා අනුනායක ස්වාමීන් වහන්සේලා හත්නමක් අත්සන් තබා හිමාලයා ප්‍රකාශය නමින් ලියවිල්ලක් එළිදැක්වීම පිටුපස පවතින අරමුණු කුමක්දැයි වටහාගැනීම මේ මොහොතේදී ඉතා වැදගත් වනු ඇත. ඊට හේතුව ඒ ආශ්‍රිතව රඟ දැක්වෙන නාට්‍යය යම් මාර්ග සිතියමකට අනුව සිදුකෙරෙන බව පෙනී යාමය. එක් පැත්තකින් මෙම ලේඛනය ජනාධිපතිවරයාට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ මහා නායක හිමිවරුන්ට පිළිගන්වමින් ඊට විශාල ප්‍රසිද්ධියක් ලබා දීමට සහ එය ජනගත කිරීමට උත්සාහයක් ගන්නා අතර තවත් පැත්තකින් යාපනයේ ඊනියා සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් පිරිසක් යොදා ගනිමින් ඊට විරෝධයක් මතු කරන ආකාරය දැක ගත හැක. එසේ විරෝධය දැක්වීම මගින් බහුතර සිංහල ජනතාව සහ භික්ෂු සමාජය තුළ සැකය සහ බිය වර්ධනය වීම වැළැක්වීම සඳහා යම් උත්සාහයක් ගන්නා බව ඉතා පැහැදිලිය. බෙදුම්වාදීන් අතරින්ම ඊට විරෝධය පළ කෙරෙන විට එහි භයානක කරුණු හෙවත් බෙදුම්වාදීන්ගේ න්‍යාය පත්‍රයක් අඩංගු නොවන බවට ස්වාභාවිකවම මතයක් ඇති වේ.

මීට පෙර 2003 දී 'එක් ලේඛනයක්' හෙවත් ''One Text Initiative"නමින් වෙස් මුහුණක් සහිතව අද කරනු ලබන දෙය වෙනත් ආකාරයකට කිරීමට උත්සාහ කරනු ලැබීය. එහිදී බෙදුම්වාදී බලවේග සෘජුව ඊට දායක නොවී බර්ගොෆ් පදනම නම් වූ බෙදුම්වාදයට පක්ෂපාතී ජර්මානු රාජ්‍ය නොවන සංවිධානයක් යොදාගනු ලැබීය. එහි අරමුණ වූයේ බලය බෙදීමේ ක්‍රියාවලිය අනතුරුදායක නොවන බවට සමාජ මතයක් ඇති කිරීම සඳහා එම මල්වට්ටියට ජාතිකවාදී බලවේග විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලා ලවා අත ගස්සවා ගැනීමය. නමුත් එදා පැවති බරපතළ සමාජ විරෝධය තුළ මුදල් විසි කිරීම සහ විදේශ සංචාර මගින් හෝ එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට නොහැකි විය. දැන් පවතින අර්බුදය තුළ බෙදුම්වාදී බලවේග වෙස් මුහුණු ගලවා සෘජුව එම ක්‍රියාවලියට නැවත අත ගැසීමට ඉදිරිපත් වන්නේ ඉන්දියාවේ හිටපු තානාපති මිලින්ද මොරගොඩ මහතාගේ මග පෙන්වීම අනුව බවට ද රාවයක් පවතී.

මේ දිනවල මිලින්ද මොරගොඩ මහතා විසින් ගෝඨාභය රාජපක්ෂ මහතා හැසිරවීම සඳහා යොදාගත් ආර්. ඒ. ඩී. සිරිසේන නැමැති හිටපු මන්ත්‍රීවරයා යොදා ගනිමින් ප්‍රධාන පෙළේ භික්ෂූන් වහන්සේලා මුණගැසීමට ද කටයුතු කරන බව රහසක් නොවේ. කුමන අර්ථයෙන් විග්‍රහ කළ ද මීට පෙර එක් භික්ෂූන් වහන්සේ නමක් හෝ බෙදුම්වාදී න්‍යාය පත්‍රයට ගොදුරුකර ගැනීමට නොහැකිව තිබූ තත්ත්වය වෙනස් කිරීමට මිලින්ද මොරගොඩ මහතා සමත් වී ඇති බව පිළිගැනීමට සිදුවේ. මේ වන විට ජනාධිපතිවරයා විසින් තමා 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට ක්‍රියා කරන බව ඒකපාර්ශ්වීයව ප්‍රකාශයට පත් කර ඇත. මීට පෙර ජනාධිපතිවරුන් 7 දෙනෙකුට කුමන තත්ත්වයක් යටතේ හෝ එවැනි ප්‍රකාශයක් සිදු කිරීමට ධෛර්යයක් තිබුණේ නැත. ඊට හේතුව 13ට එරෙහිව පවතින මහජන විරෝධය බව ඉතා පැහැදිලිය. එම විරෝධය 13ට පමණක් නොව බෙදුම්වාදීන්ගේ ම්ලේච්ඡත්වයට ද එරෙහිව පවතින විරෝධයක් බවට විවාදයක් නැත. සිංහල ගම්වලට පැන අහිංසක සිවිල් ජනතාව කැතිවලින් කෑලිවලට කපා මරා දැමීම, ගර්භනී මාතාවන්ගේ උදරය පළා දරුවන් එළියට ඇද කපා දැමීම, සිවුරු දරා සිටි භික්ෂූන් වහන්සේලා අමු අමුවේ කපා කොටා ඝාතනය කිරීම වැනි ම්ලේච්ඡ ක්‍රියා සිදු කිරීමට හිස්බුල්ලා හෝ හමාස් වැනි ඉස්ලාම් අන්තවාදී සංවිධාන පවා ධෛර්යවත් වී නැත.

කෙසේ වෙතත් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සඳහා ඊට එරෙහිව පවතින ව්‍යවස්ථාමය බාධක කිහිපය පරිපාලනමය වශයෙන් සමනය කිරීම හෝ ව්‍යවස්ථා සංශෝධනයක් මගින් ඉවත් කිරීම හෝ එම ක්‍රියාවලි දෙකම හෝ අවශ්‍යවේ. එවැන්නකට ප්‍රබල මහජන විරෝධයක් එල්ල වන බැවින් උපක්‍රම දෙකක් අනුගමනය කෙරෙන බව පෙනේ. පළමුවැන්න හිමාලයා ප්‍රකාශය වැනි ක්‍රියාමාර්ග මගින් මහජනයාගේ සහ භික්ෂු සමාජයේ මානසික බාධක ඉවත් කිරීමය. දෙවැන්න සුළු ජන ඡන්ද පදනම තුළ විශ්වාසය ගොඩනැගීමය. ඒ අනුව බොහෝ විට නිශ්චිත ක්‍රියාමාර්ග ගනු ලබන්නේ එම ඡන්ද පදනම යොදා ගැනීම මගින් සහ බහුතර සිංහල ජනතාවගේ බිය සැක තුරන් කිරීම මගින් ඉදිරි ජනාධිපතිවරණය දිනා ගැනීමෙන් පසුව බව උපකල්පනය කළ හැක. ඒ නිසා මේ එන්නේ කසකරුවන් බව ඉතා පැහැදිලිය. හිමාලයා ප්‍රකාශය ගත්විට ඒ මගින් දහතුන බලාත්මක කිරීමේ අඬහැරය ශක්තිමත් කෙරෙන අතර එතැනින් ඔබ්බට ගොස් අදාළ ක්‍රියාවලිය' තවදුරටත් සාධාරණීකරණය කිරීම සහ 13 ප්ලස්' හෙවත් ඊට එහා යන බලය බෙදාගැනීමකට අදාළ කතිකාවක් ආරම්භ කෙරේ.

උදාහරණයක් ලෙස පළමු වගන්තිය මඟින් බහු වාර්ගිකත්වය ආරක්ෂා කිරීම සහ සුළු ජන කොටස් අතර අනාරක්ෂිත මතයක් ඇති නොකිරීම අවධාරණය කෙරේ. ඒ මගින් කියැවෙන්නේ දැනට ඊට පටහැනි තත්ත්වයක් රට තුළ පවතින බවයි. ඒ අනුව දේශීයව සහ ජාත්‍යන්තරව නැවත වටයකින් දෙමළ ජනතාවට අසාධාරණයක් සිදුවන බවට නිර්මාණය කරන මතයට සුජාතභාවය ලබා දීම සිදුවේ. එහෙත් සත්‍ය තත්ත්වය ඊට සපුරා පටහැනි බව රහසක් නොවේ. වැල්ලවත්තේ වේල් කරත්තයට සිංහල ජනයාගේ වැඳුම් පිදුම් මිස බාධාවක් හෝ විරෝධයක් කිසි දිනක එල්ල නොවුණද රාසමානික්කම්ලා උතුරු නැගෙනහිර සිංහල ජනතාවට ගහක් යට බුදු පිළිමයක් තබා වන්දනා මාන කිරීමට ද ඉඩ දෙන්නේ නැත. එවැනි තත්ත්වයක් තුළ හිමාලයා ප්‍රකාශයේ පළමු වගන්තිය යටි අරමුණක් සහිත ව්‍යාජ ප්‍රකාශයකි.

අප රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෙවත් මූලික නීතිය මඟින් සුළු ජනයාට වෙනස්කමක් සිදුවනවා නම් ඒ කුමන වගන්තිය අනුවදැයි ඊට අත්සන් තැබූ සිවුරු දරා සිටින භික්ෂූන් වහන්සේලාගෙන් ප්‍රශ්න කළ යුතුය. එහිදී ගෝලීය ද්‍රවිඩ සංසදයේ නායකයින්ට අබමල් රේණුවක හෝ හෘද සාක්ෂියක් තිබේ නම් ඔවුන් අවධාරණය කළ යුත්තේ උතුරේ 65%කට අධික කුලහීන ජනයාට වෙල්ලාලයින් විසින් සිදු කරන වෙනස්කම් අවම කිරීම සඳහා සමාජ දුබලතාවන් වැළැක්වීමේ පනත බලාත්මක කළ යුතු බවය. හිමාලයා ප්‍රකාශයේ දෙවන වගන්තිය කැරට් අලයකි. ඔවුන් පවතින ආර්ථික මොඩලය වෙනස් කළ යුතු බව සඳහන් කරන්නේ යම් සුජාතභාවයක් ලබා ගැනීමට බව ඉතා පැහැදිලිය. නමුත් පවතින දූෂිත සහ පරාධීන ආර්ථික මොඩලය සහ ඒ මගින් ඇති වූ අර්බුදය ඔවුන්ට ආශිර්වාදයක් වී ඇති බව සැඟවිය නොහැක. කෙසේ වෙතත් එම වගන්තියේ යටි අරමුණ වන්නේ 'ඩයස්පෝරාවේ ඩොලර්වලින් උඹලාට ගොඩයාමට හැකිය' යන මතය නිර්මාණය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම වැදගත් බව අවධාරණය කිරීමය. උදාහරණයක් ලෙස පළාත් සභා මැතිවරණය පවත්වා වහාම මහ ඇමති අරමුදල් ප්‍රඥප්තිය සම්මත කිරීම මගින් ඩයස්පෝරාවේ ඩොලර් උතුරේ ආයෝජනය කිරීමට පහසුකම් සැලසීම ඒ තුළින් සාධාරණීකරණය කෙරේ.

හිමාලයා ප්‍රකාශයේ තුන්වන වගන්තිය මගින් බලය බෙදීම සහ බලය බෙදාගැනීම යන ක්‍රියාවලි දෙකම අවධාරණය කෙරෙන අතර ඊට අදාළව නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව ඉදිරිපත් කරයි. ඒ අනුව අදාළ ප්‍රකාශයට අත්සන් කළ භික්ෂූන් වහන්සේලා මහජනයාට කියන්නේ නව ව්‍යවස්ථාවක් මගින් 13ට එහා යන බලයක් ලබාදිය යුතු බව සහ පවතින දහතුන්වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කළ යුතු බව නොවේද? ඒ මගින් ජනාධිපතිවරයාට පහරදීම සඳහා භික්ෂූන් වහන්සේලා විසින් බෝලය උස්සා දීමක් සිදුවේ. එය මීට පෙර ඉතිහාසයේ කිසි දිනක සිදුවූ දෙයක් නොවේ. බලය බෙදාගැනීම හෙවත් Power Sharing යන වචන මෙම ප්‍රකාශය මගින් හඳුන්වා දෙන්නේ ඒකපාර්ශ්වීය 13 බලාත්මක කිරීමට අමතරව එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නව වටයකින් සාකච්ඡා ක්‍රියාවලියක් ආරම්භ කළ යුතු බව අවධාරණය කිරීම සඳහා බව ඉතා පැහැදිලිය.

රටවල් බෙදා වෙන්කිරීම සඳහා, ස්වයං පාලනය ප්‍රචලිත කිරීම සඳහා යොදාගන්නා ජාත්‍යන්තර විද්වත් කථිකාවන් තුළ 'බලය බෙදා ගැනීම' යන්න නිර්වචනය කෙරෙන්නේ ස්වයං පාලනය ඉල්ලා යුද වදින පාර්ශ්වයක් සමග සටන් විරාමයක් සඳහා ජාත්‍යන්තර එකඟතාවක් වෙනුවෙන් පවත්වන සාකච්ඡාවක අවසන් අරමුණ ලෙසය. අදාළ පාර්ශ්වය සතුටු වන ආකාරයට බලය බෙදාගැනීමේ සාකච්ඡා සිදු නොවන්නේ නම් නැවත ගැටුම් ආරම්භ වන බව ඒ තුළින් කියවේ. ඊට අමතරව එවැනි ක්‍රියාවලියක් බොහෝ විට සිදුවන්නේ ජාත්‍යන්තර මැදිහත්වීමක් සහිතව දෙපාර්ශවය විසින් ගිවිසුමක් ඇති කර ගැනීම මගිනි. එහිදී ආකාර දෙකකට එම සාකච්ඡා සිදුවේ. පළමුවැන්න භූගෝලීය වශයෙන් යම් පළාත් ඒකකයකට මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක සහ විධායක බලතල යම් ප්‍රමාණයක් පවරාදීමය. ඒ මගින් පරමාධිපත්‍යයේ බලය බෙදීම සිදුවන අතර මධ්‍යම රජයට අමතරව ස්වෛරී බලතල සහිත ඒකකයක් බිහිවේ. එසේ බලතල

බෙදා දීම මගින් ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය වේ. ශ්‍රී ලංකාවේ චන්ද්‍රසෝම එදිරිව සේනාධිරාජා නඩු තීන්දුව අනුව ව්‍යවස්ථාවේ ඒකීය වගන්තිය එසේම තිබියදී එවැනි ෆෙඩරල් පාලනයක් බිහි කළ හැක.

මේ වන විට 13 වැනි සංශෝධනය මගින් අර්ධ ෆෙඩරල් පාලනයක් බිහිකර ඇති අතර පවතින ව්‍යවස්ථාමය බාධක ඉවත් කළහොත් පූර්ණ ෆෙඩරල් රාජ්‍යයක් බිහිවේ. මේ වන විට බෙදුම්වාදී යුද්ධය පරාජය කිරීම මගින් බෙදුම්වාදීන්ගේ කේවල් කිරීමේ බලය බිඳ දමා ඇති බැවින් නැවත වටයකින් සාකච්ඡා මේසයකදී කේවල් කිරීමේ අවස්ථාව අවම වේ. ඒ අනුව හිමාලයා ප්‍රකාශය මගින් එම අවස්ථාව නිර්මාණය කර ගැනීමට උත්සාහ ගන්නා බව පැහැදිලිය. ඊට අමතරව බලය බෙදාගැනීමේ සාකච්ඡා මේසයකදී සාකච්ඡාවට ලක්වන දෙවන පැතිකඩ මධ්‍යම රජයේ බලය තවදුරටත් දුර්වල කර පළාත් බලය ශක්තිමත් කිරීමය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සෙනෙට් සභාවක් ඇති කිරීම මගින් පාර්ලිමේන්තු බලය දුර්වල කිරීම සහ මධ්‍යම රජයේ නීති දුර්වල කිරීම ඊට අයත් වේ.

උදාහරණයක් ලෙස දැනටමත් කතාබහට ලක්වන ආකාරයට පුරාවිද්‍යා ආඥා පනත, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනත, වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනත, මහවැලි පනත, වනජීවී සහ වන සංරක්ෂණ පනත ආදිය සංශෝධනය කිරීම සහ තව නොබෝ දිනකින් සම්මත කිරීමට නියමිත ජල කළමනාකරණ පනත මගින් මධ්‍යම රජයට ලබාදී ඇති බලය දුර්වල කර පළාත් ආණ්ඩු ශක්තිමත් කිරීම එම නව සාකච්ඡා ක්‍රියාවලියේ දෙවන අරමුණ වනු ඇත. පළමු අරමුණ වන භූගෝලීය ඒකකයට බලය බෙදීම දැනටමත් සිදුකොට ඇති තත්ත්වය යටතේ 13 පූර්ණ වශයෙන් බලාත්මක කිරීමට අදාළ ව්‍යවස්ථා සංශෝධන සහ පරිපාලන ක්‍රියාවලියට අදාළ මාර්ග සිතියම එම නව සාකච්ඡා මේසය මතට ගෙනවීමට අවස්ථාව ලැබේ. ඒ අනුව මෙම ප්‍රකාශයට බලය බෙදාගැනීම හෙවත් ඡදඅැර්‍යරසබට යන වචන ඇතුළු කිරීමේ යටි අරමුණ පැහැදිලි වේ.

ඊට අමතරව හතරවැනි වගන්තිය මගින් එක්සත් හෙවත් United යන වචනය නැවත කරළියට ගෙනවිත් ඇත. මීට පෙර යහපාලන යුගයේදී ටී.එන්.ඒ. පක්ෂය විසින් ව්‍යවස්ථා සම්පාදක සභාවට එම යෝජනාව ඉදිරිපත් කරනු ලැබීය. කෙසේ වෙතත් එය යථාර්ථයක් බවට පත් කළ හැක්කේ ජනමත විචාරණයක් අවශ්‍ය වන ව්‍යවස්ථා සංශෝධනයක් හෝ නව ව්‍යවස්ථාවක් මගින් පමණි. නමුත් රටේ බහුතර ජනතාවගේ අනුකම්පාවට යටත්ව ඊළම දිනා ගැනීමට බෙදුම්වාදීන් අපේක්ෂා නොකරන බව ඉතා පැහැදිලිය. 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම මගින් සහ මධ්‍යම රජයේ නීති සංශෝධනය කිරීම මගින් ඔවුන්ගේ අරමුණු 100%කින් ඉටු කර ගැනීමට අවස්ථාව ලැබේ. ඒ අනුව වැඩි දෙයක් ඉල්ලන්නේ අවශ්‍ය දේ ලබා ගැනීම සහතික කිරීම සඳහා බව ඉතා පැහැදිලිය. ඊට අමතරව 'එක්සත්' වගන්තියට පහරදීම මගින් සහ එය ඉටු නොකිරීම මගින් බෙදුම්වාදීන්ට වුවමනා දේ නොදෙන බවට ව්‍යාජ මතයක් ඇති කිරීමට ද අවස්ථාව ලැබේ.

ලේඛනයේ පස්වැනි වගන්තිය මගින් 'වගවීම' පිළිබඳව සඳහන් කරන්නේ ආරක්ෂක හමුදාවලට එරෙහි යුද අපරාධ චෝදනා එල්ල කිරීමේ ක්‍රියාවලිය නැවත ඉහළට එසවීම සඳහා සහ සත්‍ය සෙවීමේ කොමිසම නමින් පිහිටුවීමට සූදානම් වන යාන්ත්‍රණයට සුජාතභාවය ලබා දීමටය. බෙදුම්වාදීන්ට යම්කිසි නම් කළ හමුදා නිලධාරියකුට විරුද්ධව පළිගැනීමේ උවමනාව තිබිය හැකි වුවත් ඔවුන්ගේ අවසන් අරමුණ එසේ තෝරා ගත් පිරිසකට දඬුවම් කිරීමට වඩා 'දඬුවම් කෙවිට' පෙන්වා ආණ්ඩුව සහ ආරක්ෂක හමුදා බියගැන්වීම බව ඉතා පැහැදිලිය. ඒ මගින් දඬුවම් කිරීම වෙනුවට ඒ හිලව්වට බෙදුම්වාදී න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයාමට අවස්ථාව නිර්මාණය වේ. මේ වන විට ඔවුන් යුද්ධයට නායකත්වය ලබාදුන් දෙපළකට දේශපාලන වශයෙන් දඬුවම් ලබාදී අවසන් බැවින් යුද අපරාධ චෝදනා ගැන සඳහන් වන්නේ හුදු කේවල් කිරීම සඳහා පමණක් බවට උපකල්පනය කළ හැක.

කෙසේ වෙතත් ආරක්ෂක හමුදාවලට සමස්තයක් ලෙස දඬුවම් කිරීම දැනටමත් ආරම්භ කර ඇති බැවින් බෙදුම්වාදීන් ඒ මගින් සෑහීමකට පත්වන බව පිළිගත හැක. යුද හමුදා පිරිස් බලය ලක්ෂයක් දක්වා එනම් 50%කින් අඩු කිරීම සහ නාවික හමුදා බලය 30000 සහ ගුවන් හමුදා බලය 20000 දක්වා අඩු කිරීම මෙන්ම ඒ මගින් උතුරු නැගෙනහිර කඳවුරු ඉවත් කිරීමට අවස්ථාව නිර්මාණය කර ගැනීම බෙදුම්වාදීන්ගේ ප්‍රබල ජයග්‍රහණයකි. හිමාලයා ප්‍රකාශයේ හයවැනි වගන්තිය මගින් ජාත්‍යන්තර ගිවිසුම් විශේෂයෙන්ම ඉන්දු - ලංකා ගිවිසුමට අනුව කටයුතු කිරීම අවධාරණය කෙරේ. ඒ ආකාරයට මෙම ලේඛනය තුළ බෙදුම්වාදීන්ගේ මාර්ග සිතියම අඩංගු වන බව ඉතා පැහැදිලිය. ඒ අනුව ඊට අත්සන් තැබූ භික්ෂූන් වහන්සේලා විසින් සිදු කරන ඓතිහාසික පාවාදීමේ තරම පොදු ජනයාට මෙන්ම මහා නායක හිමිවරුන්ට ද ඉතා හොඳින් වටහා ගත හැක.

## හිමාලයා ප්‍රකාශය (සිංහල පරිවර්තනය)

සෑම පුද්ගලයෙකුටම සාමකාමීව, ගෞරවය මෙන්ම විශ්වාස සහිතව සහ සැකයට භාජනය වීම පිළිබඳ බියෙන් තොරව සමාන අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි ශ්‍රී ලංකාවක් සඳහා....

**ප්‍රකාශ අංක 01**

කිසිදු ජනකොටසකට තමාගේ අනන්‍යතාවය සහ අභිමානය තර්ජනයට ලක්වන බවක් නොහැඟෙන ආකාරයට රටේ පවතින බහුත්ව ස්වභාවය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**ප්‍රකාශ අංක 02**

ආර්ථික අර්බුදය ජය ගනිමින්, දේශීය නිෂ්පාදනය දිරිගැන්වෙන සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ මෙන්ම සෙසු පුද්ගලයන්ගේ මැදිහත්වීම සහ ආයෝජනයට පහසුකම් සලසමින්, රට ආර්ථික වර්ධනය වේගවත් කරනු ලබන මාවතකට අවතීර්ණ වන බව සහතික කෙරෙමින් සහ ශ්‍රී ලංකාව ශක්තිමත් මධ්‍යම ආදායම් සහිත රටක් බවට පත්කරමින් රටට සුදුසු ආර්ථික සංවර්ධන මොඩලයක් තේරීම.

**ප්‍රකාශ අංක 03**

පුද්ගලයින් සහ සමූහ වශයෙන් අයිතිවාසිකම් සහතික කෙරෙන, මහජනයා අතර සමානාත්මතාවය සහ සමාන රටවැසි භාවය ප්‍රවර්ධනය කෙරෙන, මහජනයාට වගවන ආයතන පද්ධතියක් දිරිමත් කෙරෙන, ප්‍රමාණවත් බලය බෙදීමක් සහතික කෙරෙන නව ව්‍යවස්ථාවකට ප්‍රවේශ වීම සහ එතෙක් දැනට ව්‍යවස්ථාවේ පවතින බලය බෙදා ගැනීමට අදාළ ප්‍රතිපාදන විශ්වාසනීය ලෙස ක්‍රියාත්මක කිරීම.

**ප්‍රකාශ අංක 04**

එක්සත් සහ නොබිඳුනු රටක බලය බෙදීම, මහජනයාගේ ආගමික සංස්කෘතික අනෙකුත් අනන්‍යතාවයන් පිළිගනිමින් සහ ඒවාට ගරු කිරීමත්, ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් අතර විශ්වාසය ස්ථාපිත කිරීම.

**ප්‍රකාශ අංක 05**

සංහිඳියාව සහිත, ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්නා සහ වගවීම සඳහා ක්‍රියාමාර්ග නිර්මාණය කරන ශ්‍රී ලංකාවක් පරිකල්පනය කිරීම මෙන්ම අතීත වේදනාකාරී තත්ත්වයන් නැවත සිදු නොවන බවට වගබලා ගැනීම.

**ප්‍රකාශ අංක 06**

ද්විපාර්ශවීය සහ බහු පාර්ශවිය ගිවිසුම් සහ ජාත්‍යන්තර බැඳීම්වලට යටත්වීම, ස්වාධීන සහ ක්‍රියාශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා පියවර ගැනීම සහ ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී, සාමකාමී සහ සෞභාග්‍ය සම්පන්න ජාතීන් අතර ශ්‍රී ලංකාවේ අභිමානවත් ස්ථානය තහවුරු කිරීම.

**මෙම ප්‍රකාශයට අත්සන් කළ භික්ෂූන් වහන්සේලා හත්නම**

..............................................
Ven. Madampagama Assaji Tissa Thero, Anu Nayake of Ambagahapitiya Chapter

..............................................
Ven. Siyambalagaswewa Wimalasara Thero Chief Sanganayake of Northern & Eastern Provinces

..............................................
Ven. Kithalagama Hemasara Nayake Thero, General Secretary, Siri Dharmarakshitha Chapter

..............................................
Ven. Prof. Pallekande Rathnasara Thero, Acting Mahanayake of Vajirawansa Chapter

..............................................
Ven. Kalupahana Piyaratana Thero of Sri Saddharmawansa Chapter, Member of SL Human Rights Council 2023 chairperson of Human Development edification center

..............................................
Ven. Narampanawe Dhammaloka Thero Chief Sanganayake of Central Province

..............................................
Ven. Walatara Sobitha Anunayake Thero, Sri Sadhammawansa Chapter

# දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය

2023-12-22